සැ. යු. - 2010.09.24 දින පළ වූ අංක 1,673 දරන ගැසට් පත්‍රයේ I-II (අ) සහ IV (අ) කොටස් පළ නොවිය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම පළ කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,674 - 2010 ඔක්තෝබර් මස 01 වැනි සිකුරාදා - 2010.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1594 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1597 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1514 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රිදීගම ප්‍රාදේශීය සභාව

රිදීගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරාගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 වැනි දින අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන, සේවක ගණයට අයත් තනතුරු සඳහා බඳවා ගැනීම.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *සේවක ගණය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු.11,730-10x120-10 x 130 -10 x145-12 x160-රු.17,600- PLI - 2006 A |

*01. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-*

*බාහිර අයදුම්කරුවන් සඳහා :-*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02කින්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-*

දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.

1.2 දැනට සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

1.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

1.4 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

1.5 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට රිදීගම ප්‍රාදේශීය සභා පාලන බල ප්‍රදේශය තුල වසර 03ක පදිංචිය සනාථ කළ යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් අත්සන් කර නිකුත් කරන ලියවිල්ලකින් සනාථ කළ යුතුය.).

1.6 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

1.7 දැනටමත් රාජ්‍ය /පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එහි පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

1.8 රිදීගම ප්‍රාදේශීය සභාවේ ස්ථිර / අනියම් / ආදේශක / කොන්ත්‍රාත් / දීමනා පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය).

*02. සේවා කොන්දේසි :-*

2.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය.

2.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ සිය රාජකාරි, වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වී තිබේ නම් අවසානයේදී ස්ථිර කරනු ලැබේ.

*03. අයදුම්පත් ඉල්ලුම් කිරීම :-*

3.1 අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2010.10.25 වැනි දිනට පෙර "ලේකම්, රිදීගම ප්‍රාදේශීය සභාව, රිදීගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3.2 අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ තනතුරු සඳහන් කළ යුතුය.

04. ඉල්ලුම්පත් සලකා බලා මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ සම්පූර්ණ බලතල රිදීගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2010 සැප්තැම්බර් මස 13 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය,
රිදීගම.

ආදර්ශ අයදුම්පත්‍රය

**රිදීගම ප්‍රාදේශීය සභාව**

........................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

01. *(අ)* මුලකුරු සමග නම :————————.
*(ආ)* සම්පූර්ණ නම :————————.
02. ලිපිනය :————————.
03. උපන් දිනය :————————.
අවුරුද්ද :————————. මාසය :————————. දිනය :————————.
04. ස්ත්‍රී / පුරුෂ භාවය :————————.
05. විවාහක / අවිවාහක බව :————————.
06. ජාතිය :————————.
07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :————————.
08. අධ්‍යාපන සුදුසුකම් :————————. (සහතිකවල පිටපත් අමුණන්න)
09. ඔබ දැනටමත් මෙම තනතුරේ ආදේශක සේවයේ යෙදෙන්නේ නම් සේවා කාලය සහ විස්තර :————————.
(ස්ථිර / අනියම් / තාවකාලික / ආදේශක / දීමනා පදනම ද යන වග)
10. පලපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————.
(සහතිකවල පිටපත් අමුණන්න)

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වුත්, ඒවා බව සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

10-115

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් අලව්ව ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් තාවකාලික සහ සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| | *තනතුර* | *පුරප්පාඩුව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | ආයුර්වේද කම්කරු | 01 | PL-1-රු. 11,730-10x130-10x145-12x160-රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) |
| 2. | වෙළඳසැල් පරිපාලක | 01 | PL-1-රු.11,730-10x120-10x130-10x145-12x160 -රු.17,600 | එම |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :-*

1. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාවය මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ සේවයෙන් පහ නොකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහ කර ඇත්තා වූ හෝ සිය තනතුර අතහැර ගියා වූ තැනැත්තෙක් නොවිය යුතුය.
2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සිදු කරන ලද සාපරාධී වරදකට අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
3. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

6. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාල ප්‍රාදේශීය ලේකම් අත්සන් කර නිකුත්කල ලියවිල්ලකින් සනාථ කළ යුතුයි).

7. ආයුර්වේද කම්කරු තනතුර සඳහා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක සේවය කර තිබීම, වෙළඳසැල් පරිපාලක තනතුර සඳහා වෙළඳසැල් පරිපාලක රාජකාරී පිළිබඳ දැනුමක්, පලපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

8. දැනට සේවයේ නියුතු අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.

9. දැනටමත් රාජ්‍ය / පළාත් සභා සේවයේ නිරත අයෙකු නම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුල අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එහි පූර්වාසන්න වසර 05 ක් තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය ඃ-*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

සේවා නියුක්ත කරවීමේ කොන්දේසි ඃ-

1. මෙම තනතුරු ස්ථිර. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
2. රජයේ ප්‍රතිපත්තිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වයඹ පළාත් සභාව විසින් වරින් වර පනවනු ලබන රීති හා නියෝග වලට ද ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස් දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුයි.
3. රජයේ නිළධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැන්පත් කළ යුතුයි.
4. රජයේ ප්‍රතිපත්ති වලට අදාලව නියම කරනු ලබන භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.
5. පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොමැති සේවකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය ඃ-*

නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2010.10.31 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව, නාරම්මල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම්, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අතින් භාර දී එය භාර දුන් බව සනාථ කරගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙලවරේ."...................... (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් හට අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය ඃ-

1. උප්පැන්න සහතිකය.
2. අධ්‍යාපන සහතික.
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය.
4. මෑතකදී ලබා ගත් ග්‍රාම නිළධාරී සහතිකයක්.
5. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්.
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.
7. විශේෂ සුදුසුකම් පිළිබඳ සහතික.

ඉල්ලුම්පත් සලකා බලා මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

2010 සැප්තැම්බර් මස 07 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

*ආදර්ශ අයදුම්පත*

*අලව්ව ප්‍රාදේශීය සභාව*

.......................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. *(අ)* මුලකුරු සමග නම :————————.
   *(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————.
3. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:————————.
4. ස්ථිර ලිපිනය:————————.
5. ස්ත්‍රී / පුරුෂ භාවය:————————.
6. විවාහක / අවිවාහක බව:————————.
7. උපන් දිනය ඃ
   .............................. දිනට වයස අවු :————————. මාස :————————. දින :————————.
8. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
9. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? / ලියාපදිංචි වීමෙන් ද?:————————.
10. අධ්‍යාපන සුදුසුකම් :————————.
11. වෙනත් සුදුසුකම්:————————.
12. වෘත්තීය සුදුසුකම්:————————.
13. විශේෂ සුදුසුකම්:————————.
14. සේවා පළපුරුද්ද:————————.
    (i) දැනට සේවය කරන ආයතනය:————————.
    (ii) දැනට දරන තනතුර:————————.
    (iii) එම තනතුරට පත්වූ දිනය:————————.
    (iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා පළපුරුද්ද :————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙහි සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත් සහතික කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

10-19

---

# පළාත් පාලන නිවේදන

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය

කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශවල දේපළවලින් වාර්ෂික වටිනාකමින් සියයට තුන (3%) බැගින් වූ වරිපනම් ප්‍රතිශතයක් අයකිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ ව/ප්‍රඅලේ/ආ08/64 හා 2010.03.05 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
එස්.ඒ.ඩී. විජිත ප්‍රේමලාල්,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2010 අගෝස්තු මස 25 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-31

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

මා විසින් 2010 මැයි මස 21 වැනි දින අංක 1655. 2010 අප්‍රේල් මස 09 වැනි දින අංක 1649 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ පල කරන ලද අරණායක ප්‍රාදේශීය සභාව සතු පාරවල් පිළිබඳ නිවේදනයේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන සියළුම පාරවල් අරණායක ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) (1) ඡේදය ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

ඩබ්. ආර්. ගාමිණි සනත් බණ්ඩාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2010 සැප්තැම්බර් මස 09 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. මාර්ගයේ නම :- දිප්පිටිය බුදවත්ත මාර්ගය ;
   මාර්ගයේ ආරම්භය හා අවසානය :- දිප්පිටිය බුදවත්ත මාර්ගයේ සිට දිප්පිටිය ගම හරහා විල්පොල දක්වා මාර්ගය;
   මාර්ගයේ දිග :- මීටර් 276, පළල :- අඩි 10 ;
   ග්‍රාම නිලධාරී වසම :- දිප්පිටිය.

2. මාර්ගයේ නම :- අට්ටාපිටිය පාලම ලඟ සිට කෝන්ගහකැලේ වත්ත කට්ටි අංක 79 දක්වා;
   මාර්ගයේ ආරම්භය හා අවසානය :- අට්ටාපිටිය හිඟුල මාර්ගයේ අට්ටාපිටිය පාලම අසලින් ආරම්භව කට්ටි අංක 1.2.32.33.35.36.37.77.76.78.79.74 දක්වා;
   ග්‍රාම නිලධාරී වසම :- අට්ටාපිටිය;
   මාර්ගයේ දිග :- මීටර් 650;
   පළල :- පාලම අසල සිට අංක 1 දරන ඉඩම් කට්ටිය දක්වා පළල අඩි 30 හා අංක 1 සිට අංක 79 දක්වා පළල අඩි 20.

3. මාර්ගයේ නම :- පරගහපීල්ල දෙනිය මාර්ගය;
   මාර්ගයේ ආරම්භය හා අවසානය :- අරණායක සිට හෙම්මාතගම මාර්ගයේ ඉදුන්ගොඩ ඥානානන්ද හිමි හිමිකම් කියන ගනේකුඹුර නැමැති ඉඩමෙන් ආරම්භව බී. එම්. හීන්බණ්ඩා මහතා හිමිකම් කියන පීල්ලදෙනිය කුඹුර ඉඩමෙන් ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වෙයි;
   ග්‍රාම නිලධාරී වසම :- අංක 41 ඩී රංදිලිගම;
   මාර්ගයේ දිග :- මීටර් 477, පළල :- අඩි 08.

10-122/2

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පාලනය කිරීමේ පනත යටතේ මහජනයා වෙත කරනු ලබන දැනුම් දීම.

මෙම මහ නගර සභා බලප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් මාර්ගය නම් කිරීම සඳහා බස්නාහිර පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව මෙම මාර්ගය පහත දැක්වෙන නම භාවිතා කිරීමට මෙම සභාව විසින් කටයුතු කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *අනු අංකය* | *මාර්ගයේ පිහිටීම* | *යෝජිත නම* |
|---|---|---|
| 01. | මිරිහාන ජුබිලි කණුව හන්දියේ ව.අ. 2ඒ, සිට ව.අ. 56 කට්ටිය හන්දිය දක්වා සහ කට්ටිය හන්දිය 3ඒ, සිට 77 ජුබිලි කණුව දක්වා වූ මාර්ගය. | ආරියදාස පීරිස් මාවත. |

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2010 සැප්තැම්බර් මස 14 වැනි දින,

10-42

## අරණායක ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ආර්. ගාමිණී සනත් බණ්ඩාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව අරණායක.

2010 සැප්තැම්බර් මස 09 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | ගන්තුන උඩගම දීග්ගල සිට කුකුල්පිටිය මාර්ගය; |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | : | ගංතුන උඩගම දීග්ගල සිට කුකුල්පිටිය දක්වා; |
| ග්‍රාම නිලධාරී වසම | : | අංක 58/බී - උඩගම ගන්තුන; |
| මාර්ගයේ දිග | : | මීටර් 463.50 , පළල ඃ අඩි 10 |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම ඃ-

| | | |
|---|---|---|
| 1. | පී. පී. සුමිත් ගුණතිලක මයා | බතල වත්ත |
| 2. | අයි. එන්. පී. සමන්ත සමන් කුමාර මයා | ගොඩපෙල |
| 3. | ආර්. පී. නිමල් සුරවීර මයා | කැනවිලගොල්ල කුඹුර |
| 4. | අයි. එන්. පී. සමන්ත සමන් කුමාර මයා | ගොඩපෙල |
| 5. | පී. පී. ජයවීර මයා | ගොඩපෙල |
| 6. | ආර්. පී. උපාලි මයා | ගොඩපෙල |
| 7. | අයි. එන්. පී. ගුණතිලක | ගොඩපෙල |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම ඃ-

| | | |
|---|---|---|
| 1. | අයි. එන්. පී. සමන්ත සමන් කුමාර මයා | ගොඩපෙල |
| 2. | එච්. පී. පත්මසිරි ගුණදාස මයා | ලබුකොටුව |
| 3. | ආර්. පී. නිමල් සුරවීර මයා | කැනවිලගොල්ල කුඹුර |
| 4. | ආර්. පී. සෝමරත්න මයා | ගොඩපෙල |
| 5. | එච්. පී. පද්මසිරි මයා | කුකුල්පිටිය කුඹුර |
| 6. | ආර්. පී. උපාලි මයා | ගොඩපෙල |
| 7. | එච්. පී. රත්නවීර මයා | කුකුල්පිටිය කුඹුර |
| 8. | එච්. පී. විජේසිංහ මයා | කුකුල්පිටිය කුඹුර |

එච්. එම්. ආර්. ටී. කේ. හේරත් බලයලත් මිනින්දෝරු මහතාගේ 2010 ජූලි මස 20 වැනි දිනැති 6814 අංක දරන පිඹුරුපත පරිදිය.

මාර්ගයේ නම ඃ- උස්සාපිටිය ආරාමය අසලින් පරණගෙදර වත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය ඃ- උස්සාපිටිය ආරාමය අසලින් ආරම්භව පරණගෙදර වත්තෙන් අවසන් වෙයි.
ග්‍රාම නිලධාරී වසම ඃ- අංක 17 උස්සාපිටිය
මාර්ගයේ දුර ඃ- මීටර් 90.50, පළල ඃ- අඩි 08

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම්හිමියන්ගේ නම් සහ ඉඩමේ නම ඃ-

| | | |
|---|---|---|
| 1. | බී. කේ. ඩබ්. ගුණදාස මයා | බණ්ඩාරවත්ත |
| 2. | බී. කේ. ඩබ්. පියසේන මයා | බණ්ඩාරවත්ත |
| 3. | එච්. විමලසේන මයා | පරණ ගෙදරවත්ත |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම්හිමියන්ගේ නම් සහ ඉඩමේ නමඃ-

| | | |
|---|---|---|
| 1. | ජී. ආර්. සෙනෙවිරත්න බණ්ඩා මයා | නුවරගොඩවත්ත |
| 2. | එච්. සුනිල් ජයරත්න මයා | හල්ලොගෙවත්ත |
| 3. | එන්. ඇලිස් නෝනා මිය | හල්ලොගෙවත්ත |

එච්. එම්. ආර්. ටී. කේ. හේරත් බලයලත් මිනින්දෝරු මහතාගේ 2010 පෙබරවාරි මස 20 වැනි දිනැති 6486 අංක දරන පිඹුරුපත පරිදි ය.

10-122/1

**මාතර මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙකී පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2011 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය ගැසට් පත්‍රයේ පලවූ දින සිට සති 04ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2010 අගෝස්තු මස 18 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්/සභාපති කළමනාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 01. ගැමුණු එරික් සමරවික්‍රම | ලේකම් | රුහුණු ක්‍රීඩා සමාජය | සමූපකාර මන්දිරය, දුම්රිය පොල පාර, මාතර. |
| 02. සුනිල් මොහොට්ටි | ලේකම් | මාතර ක්‍රීඩා සමාජය | උයන්වත්ත ක්‍රීඩාංගනය, මාතර. |
| 03. වික්‍රමසිංහ ගාල්ලගේ තුසිත | ලේකම් | ප්‍රින්ස් ක්‍රීඩා සමාජය | අංක.103, අකුරුස්ස පාර, ඉසදීන් නගරය, මාතර. |

10-139/1

---

**තංගල්ල නගර සභාව**

නගර සභා ආඥා පනතේ (255 වැනි අධිකාරිය) 55 "අ" වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥා පනතේ (255 වැනි අධිකාරයේ) 55 "අ" වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තංගල්ල නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර "දේශමාන්‍ය එන්. යූ. ජයවර්ධන මාවත" නමින් නම් කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

2010 අගෝස්තු මස 12 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | තංගල්ල නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | හම්බන්තොට |
| 3. | මාර්ගයේ වර්තමාන නම | : | මැදකැටිය පාර |
| 4. | අලුතින් යොදා ඇති නම | : | දේශමාන්‍ය එන්. යූ. ජයවර්ධන මාවත |
| 5. | මාර්ග විස්තරය | : | තංගල්ල තිස්ස පාරේ පාලම අසලින් ආරම්භව මැදකැටිය පටුමග පාර මාර්ගය අසලින් අවසන් වන මාර්ගය වේ. |

10-23

## මාතර මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2011 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට සති 04ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2010 අගෝස්තු මස 18 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලය.

### උපලේඛනය

| | *ඉල්ලුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්/සභාපති/ කළමනාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|---|
| 01. | කේ. එස්. සුනිල් අංක .80/5 රාහුල පාර, මාතර. | ලේකම් | ඕඒසිස් ක්‍රීඩා සමාජය | අංක 76, රාහුල පාර, මාතර. |
| 02. | ලලිත් සිරිවර්ධන 1/22, පොල්හේන පාර, පඹුරණ, මාතර. | ලේකම් | ජනතා ක්‍රීඩා සමාජය | අංක 50, කුමාරතුංග මාවත, මාතර. |
| 03. | උබේසිරිවර්ධන ආරච්චිගේ ලයනල් | ලේකම් | පැරකුම් ක්‍රීඩා සමාජය | අංක.71, බාතුතා පාර, මාතර. |

10-139/2

---

## මාතර මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2011 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට සති 04ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2010 සැප්තැම්බර් මස 01 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලය.

### උපලේඛනය

| | *ඉල්ලුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්/සභාපති/ කළමනාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|---|
| 01. | සුනිල් ද සිල්වා | ලේකම් | නිල්මිනි ක්‍රීඩා සමාජය | අංක 66, අලුත් තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර. |

10-139/3

**බදුල්ල මහ නගර සභාව**

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48 (1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2010.07.06 වැනි දින දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාල මාර්ගයට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

නීතිඥ, උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2010 සැප්තැම්බර් මස 09 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංකය* | *වම් පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 01 | විජයාරාම පන්සලේ දකුණු පටුමග | මහියංගන පාර | 169/11 | 169/2A, 169/4 169/6, 169/7, 169/9, 169/10, 169/11 | - | 100 m. | 4.05 m. |

10-21

---

**බදුල්ල මහ නගර සභාව**

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 48 (1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2010.06.03 දින දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාල මාර්ගයට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුළ දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

නීතිඥ උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංකය* | *වම් පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 01 | රත්වත්ත මාවත අතුරු පාර | රත්වත්ත මාවත | 29/17 | 29/7, 29/8, 29/9, 29/10, 29/15, 29/17 | 29/22, 29/29 | 200 m. | 4.5 m. |

10-22

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ඔක්තෝබර් | 2010.10.01 | සිකුරාදා | 2010.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.08 | සිකුරාදා | 2010.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.15 | සිකුරාදා | 2010.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.21 | බ්‍රහස්පතින්දා | 2010.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.29 | සිකුරාදා | 2010.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2010.11.04 | බ්‍රහස්පතින්දා | 2010.10.21 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.12 | සිකුරාදා | 2010.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.11.19 | සිකුරාදා | 2010.11.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.26 | සිකුරාදා | 2010.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2010.12.03 | සිකුරාදා | 2010.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.10 | සිකුරාදා | 2010.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.17 | සිකුරාදා | 2010.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.24 | සිකුරාදා | 2010.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.31 | සිකුරාදා | 2010.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.